**ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2017**

**---------------------------------------------**

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------**

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**----------------------------------**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දින වනවිටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වාගෙනයාම**

**-----------------------------------------------**

මණ්ඩලයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම් පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

**2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

**----------------------------------**

මණ්ඩලය විසින් අවසන් වරට පිළියෙළ කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | **වටිනාකම** |
|---|---|
| | **--------** |
| | **රු.** |
| ජංගම නොවන වත්කම් | 2,231,172,049 |
| ජංගම වත්කම් | 686,456,256 |
| මුළු වත්කම් | 2,917,628,305 |
| බැරකම් | |

| | |
|---|---|
| ජංගම බැරකම් | 2,532,160,239 |
| ජංගම නොවන බැරකම් | 725,608,431 |
| මුළු බැරකම් | 3,257,768,670 |
| ශුද්ධ වත්කම් / අයිතිය | (340,140,365) |
| | 2,917,628,305 |
| මුළු ආදායම | 571,588,867 |
| මුළු වියදම | (1,135,549,881) |
| ඌනතාවය | (563,961,014) |

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛය අනුව ඉන්ධන හා වාහන දීමනා සඳහා හිමිකම් නොමැති මණ්ඩලයේ MM වැටුප් ඛාණ්ඩයට අයත් නිළධාරීන් 07 දෙනෙකු සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන හා වාහන දීමනා ලෙස රු.4,430,160 ක් ගෙවා තිබුණි. |
| (ආ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මාණ්ඩලික නිළධාරීන්ට පමණක් වරකදී රු.100,000 ක උපරිමයකට යටත්ව තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා ගත හැකි වුවත් මණ්ඩලයේ පාරිභෝගික අංශය විසින් අදාල සීමාව ඉක්මවා අවස්ථා 16 ක දී රු.16,782,702 ක මුදලක් මාණ්ඩලික නොවන නිළධාරීන් වෙත අත්තිකාරම් ලෙස ලබා දී තිබුණි. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | සියලුම රාජ්‍ය සේවකයන්ගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍රය මඟින් සටහන් කළ යුතු වුවත්, කළමණාකරු (වන) තනතුර දරන නිළධාරිවරයා එපරිදි පැමිණීම සටහන් කර නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට මණ්ඩලය විසින් පාලනය කරනු ලබන තේ වතු 15 ට අයත් මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 10,155 ක් වුවත් එයින් ඉඩම් හෙක්ටයාර් 2936 ක පමණක් තේ වගා කර තිබුණි. ඒ අනුව සමස්ථ භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 7219 ලෙස

සියයට 71 ක ඉඩම් මණ්ඩලය විසින් තේ වගාව හෝ වෙනත් අතුරු භෝග වගාවන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා තේ කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය (COP), සාමාන්‍ය විකුණුම් වටිනාකම (NSA) හා ඒකක දායකය, පිළිබඳ සැසඳීමේදී මණ්ඩලයෙන් පාලනය වන තේ වතු 15 හිම නිම් තේ කිලෝ ග්‍රෑම් එකක දායකය සෘණ අගයක් ගෙන තිබුණු අතර එය රු.100 සිට රු.594 දක්වා වූ පරාසයක පැවතුණි. ඒ අනුව මණ්ඩලයේ නිෂ්පාදන ඒකකයක විකුණුම් ආදායමෙන් එහි පිරිවැය ආවරණය කරගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් පාලනය කරනු ලබන ගලබොඩ, රහතුන්ගොඩ හා රොක්වුඩ් යන වතු තුනෙහි නිමි තේ කිලෝ ග්‍රෑම් ඒකකයක සෘණ දායකය 2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය වනවිට සියයට 50 ට වැඩි අගයකින් පිරිහී තිබුණි. ඒ අනුව මණ්ඩලයේ වතුයායන්හි තේ වගාව සඳහා රසායනික පොහොර හා වල් නාශක වසර ගණනාවක සිට භාවිතා නොකිරීම තේ දළු නිෂ්පාදනය අඩු වීමට හේතු වී තිබුණි.

(ඈ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී තේ කර්මාන්තය සඳහා නිකුත්කර ඇති සංඛ්‍යා දත්ත අනුව හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය නිමි තේ ඵලදාව කිලෝ ග්‍රෑම් 1594 ක් වුවද සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ වතු 15 හි හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය නිමි තේ ඵලදාව කිලෝග්‍රෑම් 317 ක් හා 719 අතර පරාසයක පැවතුණි. මේ සඳහා මණ්ඩලය සතු වතුයායන් හි හෙක්ටයාරයක පවතින තේ පැල ගණන අඩු මට්ටමක පැවතීම හා නව වගාවන් ආරම්භ නොකිරීම හේතු වී තිබුණි.

(ඉ) 2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් පාලනය කරනු ලබන තේ වතු සඳහා අවශ්‍ය කෙරෙන රසායනික පොහොර නොයෙදීම හේතුවෙන් තේ වතු 15 න් වතු 14 ක තේ දළු නිෂ්පාදනයේ අඩු වීම සියයට 05 සිට සියයට 35 ක පරාසයක පැවතුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේදී ලෙවලන් වතුයායේ පරිනත තේ වගා ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 10 කින් වැඩි වුවද 2016 වර්ෂයට සාපේක්ෂව හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය නිමි තේ ඵලදාව කිලෝග්‍රෑම් 435 සිට 430 දක්වා අඩු වී තිබුණි.

(ඊ) 2016 වර්ෂයේදී මණ්ඩය සතු තේ වතු 15 න් ලෙවලන් හා මහවිල වතු දෙක හැර ඉතිරි වතුයායන් 13 ක පැවති පරිනත තේ වගා ඉඩම් හෙක්ටයාර් 3672 න් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය නිමි තේ ඵලදාව කිලෝග්රෑම් 300 ට අඩු හෙක්ටයාර් 746 ක පිහිටි තේ වගාවෙන් 2016 වර්ෂය තුලදී රු.79,618,323 ක වටිනාකමකින් යුතු තේ දළු කිලෝග්රෑම් 127,368 ක් ලබාගෙන තිබුණද, අදාල තේ ඉඩම් ප්‍රමාණයෙහි තේ අස්වනු නෙලීම සමාලෝචිත වර්ෂයේදී නතර කර තිබුණි.

(උ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී නඩත්තු කල පරිනත තේ ඉඩම් හෙක්ටයාර් 2936 ක ප්‍රමාණය හා , හෙක්ටයාරයකට ලැබෙන වාර්ෂික නිමි තේ ඵලදාව අනුව කිලෝග්රෑම් 1000 කට වැඩි ඉඩම් "A" ලෙසද, කිලෝග්රෑම් 1000 ට අඩු 500 ට වැඩි ඉඩම් "B" ලෙසද, කිලෝග්රෑම් 300 අඩු වැඩි හා 500 ට අඩු ඉඩම් "CI" ලෙසද වර්ගීකරණය කර තිබුණි. ඒ අනුව මණ්ඩලය සතු වතු 15 හි එහි වර්ගීකරණය අනුව වගා ඉඩම්වල කාර්යසාධනය පහත පරිදි විය.

   (i) වර්ගීකරණයට අනුව (A) වර්ගයේ පරිනත තේ ඉඩම් හෙක්ටයාරයක් මගින් නිමි තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 1000 ට වැඩි විය යුතු වුවත්, මණ්ඩලය පාලනය කරනු ලබන වතු 13 ක එම අගය කිලෝ ග්‍රෑම් 333 සිට 901 අතර පරාසයක පැවතීම හේතුවෙන් අදාල ඉඩම් වර්ගීකරණයේ අවම ඵලදාව හෝ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) මණ්ඩලයේ ඉඩම් වර්ගීකරණයට අනුව (B) වර්ගයේ පරිනත තේ ඉඩම් හෙක්ටයාරයක් මඟින් නිමි තේ කිලෝග්‍රෑම් 500-999 ත් අතර ප්‍රමාණයක පැවතිය යුතු වුවත් වතු 10 ක එම අගය කිලෝ ග්‍රෑම් 296-466 ක පරාසයක පැවතුණි. ඒ අනුව අවම ඵලදාව හෝ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(iii) C1 ඉඩම් වර්ගීකරණය යටතේ පවතින තේ ඉඩම් හෙක්ටයාරයකින් අවම වශයෙන් නිමි තේ කිලෝග්‍රෑම් 300 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ වතු 07 ක එම අගය කිලෝ ග්‍රෑම් 146–266 ක පරාසයක පැවතුණි.

(iv) මණ්ඩලයේ ඉඩම් වර්ගීකරණය අනුව අවම ඵලදාව හෝ ලබා ගැනීමට නොහැකි වීමට වසර සියයකට වඩා පැරණි තේ වගාවන් පැවතීම හා රසායනික පොහොර හා කෘමිනාශක භාවිතා නොකිරීම හේතු වී තිබුණි.

### 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් පාලනය කරන තේ වතු 15 න් වතු 14 ක, 2017 වර්ෂය අවසාන වන විට අනවසර පදිංචිකරුවන් 893 දෙනෙකු විසින් ඉඩම් අක්කර 861 ක ප්‍රමාණයක් අත්පත්කරගෙන තිබුණද අදාල ඉඩම් නැවත අත්පත්කර ගැනීමට හෝ බදු පදනම මත ලබා දීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දින වන විට ගිවිසුම් ගත කාලය අවසන් වූ ඉඩම් 18 කට අදාලව නව ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර නොමැති අතර පැරණි බදුකරුවන් විසින් බදු මුදල් ගෙවීමකින් තොරව අදාල ඉඩම් බුක්ති විඳිමින් පැවතුණි.

(ඇ) මණ්ඩලය විසින් පෞද්ගලික සමාගමක් වෙත 2016 වර්ෂයේදී හන්තාන වතුයායේ තේ දළු කිලෝ ග්‍රෑම් 113,318 ක් රු.5,865,670 ට අලෙවිකර තිබූ අතර එම අවස්ථාව වන විට තේ දළු මිලදී ගනු ලැබූ පෞද්ගලික සමාගම දළු මිලදී ගැනීම වෙනුවෙන් රු.7,328,456 ක මුදලක් රාජ්‍ය සමාගමක් වන ඇල්කඩුව වැවිලි සමාගම වෙත ගෙවීමට පැවතුණි. ඒ අනුව ගැණුම්කරු පිළිබඳව සොයා බැලීමකින් තොරව තේ දළු අලෙවි කිරීම හේතුවෙන් රු.5,865,670 ක මුදලක් විගණන අවස්ථාව වූ 2018 අගෝස්තු 31 දින වන විටත් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඈ) මණ්ඩලය විසින් 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා නාවික හමුදාවට තේ කොළ සැපයීම මඟින් උපයාගෙන තිබූ ආදායම රු.80,151,700 ක් වූ අතර 2018 වර්ෂය සඳහා ලංසු බාර ගැනීමේ අවසාන වේලාවට පෙර ලංසු ඉදිරිපත් කිරීමට මණ්ඩලය අපොහොසත් වීම හේතුවෙන් 2018 වර්ෂය සඳහා අදාළ තේ කොළ සැපයීමේ ඇනවුම ලබා ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

### 3.3 නිෂ්ක්‍රීය වත්කම්

හන්තාන උඩුවෙල වත්තේ තේ කර්මාන්තශාලාවෙහි නිෂ්පාදන කටයුතු 2016 ජූනි 04 දින සිට නතරකිරීම හේතුවෙන් එම කර්මාන්තශාලාවේ පවතින රු.18,898,835 ක වටිනාකමකින් යුත් යන්ත්‍ර හා අනෙකුත් වත්කම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අක්‍රියව පැවතුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---

නාය යෑමේ අවධානමක් පවතින බව සඳහන් කරමින් හන්තාන තේ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු 2016 මැයි 04 දින සිට නවතාදමා තිබුණද, මණ්ඩලය විසින් ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් හෝ භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය මගින් විධිමත් පරීක්ෂණයක් සිදුකර නැවත කර්මාන්තශාලාව විවෘත කිරීමට කටයුතු නොකර පෞද්ගලික සමාගමකට බදු පදනම මත ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයකර තිබුණි. එම සමාගම සමග ගිවිසුමකට එළඹ නොමැති වුවත් 2017 ජුලි 31 දින අදාල සමාගම විසින් රු.6,000,000 ක මුදලක් මණ්ඩලයට අයත් බැංකු ගිණුමකට සෘජුවම බැර කර තිබුණි. එම මුදල් තැන්පත් කල බවට තැන්පත්කරු විසින් මණ්ඩලය වෙත දැනුම් දී නොමැති අතර 2018 ජුලි 03 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩලයේදී තැන්පත්කරු පිළිබඳ අනාවරණය කරගෙන තිබූ බව මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂක විසින් 2018 ජුලි 06 දිනැති ලිපිය මගින් විගණනය වෙත දැනුම් දී තිබුණි.

## 3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්යමණ්ඩලය යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු නාම දෙකක් යටතේ පුරප්පාඩු 35 ක්ද තනතුරු නාම දෙකක් යටතේ අතිරික්ත 48 ක්ද පැවතුණි.

(ආ) කළමණාකරු -වන හා නියෝජ්‍ය සමාන්‍යාධිකාරී යන තනතුරු දෙකද ඇතුළත්ව අනුමත කාර්යය මණ්ඩලය තුල නොමැති තනතුරු 10 ක් සඳහා නිළධාරීන් සමාලෝචිත වර්ෂයේදී බඳවාගෙන තිබූ අතර එම නිළධාරින් සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබූ වැටුප් හා දීමනා වල එකතුව රු.3,937,772 ක් විය.

(ඇ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට 2017 ඔක්තෝබර් 16 දින සිට වර්ෂයක කාලයකට කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ලැබූ නිළධාරියා අදාල කොන්ත්‍රාත් කාලය අවසන් වීමට පෙර මණ්ඩලයේ සභාපති විසින් 2018 මාර්තු 30 දිනැති ලිපිය මගින් පරිවාස කාලයක්ද නොමැතිව සාමාන්‍යාධිකාරී තනතුර සඳහා ස්ථිරව පත්කර තිබුණි.

(ඈ) මණ්ඩලය විසින් කළමණාකරු මානව සම්පත්, කළමණාකරු නීති හා සහකාර නීති නිළධාරී(කොන්ත්‍රාත්) යන තනතුරු සඳහා නිළධාරීන් 03 දෙනෙකු 2017 වර්ෂයේදී පත්කර තිබූ අතර, අදාල තනතුරුවලට නියමිත MM 1-1 වැටුප් කාණ්ඩයේ වැටුප් පියවරක පිහිටුවීම වෙනුවට HM 1-1 වැටුප් කාණ්ඩයේ 10 වන වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවා තිබුණි.

(ඉ) සහකාර වතු අධිකාරිවරයෙකු ලෙස සේවය කල නිළධාරියකු 2016 දෙසැම්බර් 02 දිනැති ලිපිය මඟින් 2017 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමණාකරු -වන තනතුර සඳහා පත්කර MM 1-1 වැටුප් කාණ්ඩයේ 10 වන පියවරෙහි පිහිටුවා පත්වීම ලබා දී තිබූ අතර, එම වැටුප් කාණ්ඩයේ නිළධාරියකුට හිමි නොමැති සේවක දීමනා 04 ක් හා හන්තාන වතු යායේ පිහිටි වතු බංගලාවක්ද මෙම නිළධාරියා වෙත ලබා දී තිබුණි. අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ නොමැති මෙම තනතුර වෙනුවෙන්සේවක දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුලදී රු.1,144,456 ක වියදමක් මණ්ඩලයට දැරීමට සිදු වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

## 4.1 අභ්‍යන්තර විගණනය

නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වන අතර සමාලෝචිත වර්ෂයේ වාර්ෂික විගණන සැලැස්ම අනුව ප්‍රධාන කාර්යාලයේ අංශ 07 ක් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයන් සිදුකිරීමට සැලසුම්කර තිබුණද, ප්‍රධාන කාර්යාලයේ එක් අංශයක පමණක් විගණන පරීක්ෂාවක් සිදුකර තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුව පවතී.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මූලාශ්‍ර ලේඛන පවත්වා ගැනීම | ඉඩම් අංශයේ බදු ඉන්වොයිසි යාවත්කාලීනව පවත්වාගැනීම හා කාලීනව ගිණුම් හා නීති අංශ වෙත යොමු නොකිරීම. |
| (ආ) | අයවැය පාලනය | අයවැයගත නිෂ්පාදන ඉලක්ක සපුරාගැනීම හා අධීක්ෂණය කිරීම පහළ පහළ මට්ටමක පැවතුණි. |
| (ඇ) | සේවක කළමනාකරණය | අනුමත සේවක සංඛ්‍යාවට අමතරව සේවකයින් බඳවා ගැනීම, නිතීරීතිවලට පටහැනිව උසස් වීම් හා සේවය දීර්ඝ කිරීම් සිදු කර තිබීම සහ සේවකයින්ට නිසිපරිදි වගකීම් හා රාජකාරී පවරා දීම සිදුකර නොතිබුණි. |